M72

MR 3

# ඉගැන්වීමේ ආධාරක භාවිතය කෙරෙහි ද්විතීයික පාඨශාලාවේ ගුරුවරුන් දක්වන ආකල්ප සහ අදහස් පිළිබඳ සමීක්ෂණයක්

අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධිය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලය

380600

මහේෂා සුගාමිනී පැල්පොල

[illegible] ශාස්ත්‍රවේදී, අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ ශ්‍රේණිය)

1981 දෙසැම්බර්

## සං ක් ෂේ ප යෙ න් .....

විද්‍යාත්මක හා තාක්ෂණික අංශයන්ගේ උග්‍ර සංවර්ධනයකට මුහුණ දෙන යුගයක අපි ජීවත් වෙමු. විවිධ සංස්කෘතික, ආර්ථික, දේශපාලන හා සමාජයීය වෙනස්කම් මධ්‍යයේ මානව ජීවන රටාවේ විවිධ නම්‍යතාවයන් ඇතිවේ. මෙම නම්‍යතාවයන් එක් අංශයකට හෝ දෙකකට පමණක් සීමා වී නොමැත. ජීවන ක්‍රියාවලියට සම්බන්ධ සකලාංග යන් කෙරෙහිම එය බලපායි. එම සකලාංගයන් අතුරින් අධ්‍යාපන ක්‍රියා පද්ධතියට විශේෂ ස්ථානයක් හිමි වේ. එබැවින් අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවෙහි බලපෑමෙන් මිදීමට කිසිදු සමාජයකට නොහැකිය. ප්ලේටෝගේ යුගයෙහි වාචිකත්වයට නැඹුරු වූ ඉගැන්වීම් රටාව තව දුරටත් තම වෘත්තිය ක්‍රියාදාමය තුළ රඳවා ගැනීමට වත්මාන ගුරුවරයාට නොහැකිය. විශ්ව ව්‍යාප්ත විවිධ දේ පංති කාමරයට ගෙන ඒමේ භාරධූර කාර්යයට මුහුණ දී ඇති වත්මාන ගුරුවරයාට එය වාචික කරණය තුළින් සාර්ථක කරගත නොහැකිය. මෙහි ලා ඉගැන්වීමේ ආධාරකයන්ගේ සහාය පැතීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. තමා ලොවට බෙදා දෙන දැනුම පැහැදිලිවත් ,නිරවුල්වත් මනා අවබෝධයෙන් යුතුවත් ශිෂ්‍යයා උකහා ගනු ලබන්නේ ගුරුවරයා දැනුම බෙදා දීම සඳහා යොදා ගනු ලබන උපක්‍රම මතය. ඉගැන්වීමේ ආධාරක භාවිතයෙන් සැපිරෙනුයේ එම උපක්‍රමයන් සාර්ථක කිරීමකි.

දියුණු රටවල් ඉගැන්වීමේ ක්‍රියාවලිය කෙරෙහි ඉගැන්වීමේ ආධාරක වල අවශ්‍යතාවය මනාව වටහා ගෙන ඇත. ශ්‍රී ලංකාවෙහි ද ගුරු පුහුණු පාඨමාලා වලදී ගුරුවරුනට ඉගැන්වීමේ ආධාරක භාවිතය සම්බන්ධයෙන් යම් තරමකට හෝ දැනුමක් ලබා දෙන අතර ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු කාලය තුළදී කෙරෙන අධීක්ෂණ කටයුතු මගින් ඉගැන්වීමේ ආධාරක භාවිතයේ සාර්ථක–භාවය ද මැනු බලනු ලැබේ. එහෙත් සාමාන්‍ය ගුරු ජීවිතයේදී ඉගැන්වීමේ උපකරණ භාවිතයට ගුරුවරුන් තුළ පවතින්නේ මැලිකමකි. මෙම මැලිකම කෙරෙහි–

පුහුණු - නුපුහුණු බව හෝ සේවා කාලය හෝ සහතික භේදය හෝ බලපා නොමැති අතර ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළ පොදු ලක්ෂණයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම මෙම මැලිකම ප්‍රාථමික අංශයට වඩා ද්විතීයික පාඨශාලාවේ ගුරුවරුන් තුළ පිඩාත් උග්‍රව පවතී. එබැවින් ඉගැන්වීමේ ආධාරක භාවිතය කෙරෙහි ද්විතීයික පාඨශාලාවේ ගුරුවරුන්ගේ ආකල්ප සහ අදහස් සොයා බැලීම අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධි පරීක්ෂණ ව්‍යාපෘතිය සඳහා තේමාව කොට ගැනීමට අදහස් කළෙමි.

පළමුවන දෙවන හා තුන්වන පරිච්ඡේදයන්හි දී ඉගැන්වීමේ ආධාරක භාවිතයෙහි අවශ්‍යතාවය ගුරුවරයාට පැන නැගීමට හේතු වූ කරුණු පිළිබඳ විග්‍රහයක් ද ඉගැන්වීමේ ආධාරක යනු කවරේද යන්න පිළිබඳ සාරාංශගත හැඳින්වීමක්ද ඉගැන්වීමේ ආධාරක පිළිබඳ පර්යේෂණ සාහිත්‍යය ද ඉදිරිපත් කිරීමෙන් කර ඇත්තේ ඉගැන්වීමේ ආධාරක පිළිබඳ වැදගත්කම ගෙන හැර දැක්වීමට ගත් උත්සාහයකි. ඉන් පසු අවස්ථාවන් අධ්‍යයන අධ්‍යයනය සඳහා වෙන් කර ඇති අතර පර්යේෂණයෙන් හෙළි වූ තොරතුරු විග්‍රහයකින් හා ඒ පිළිබඳ නිගමනයන්ද අනාගතයේදී ඵලදායී ඉගැන්වීමක් ගුරුවරුන් අතින් සිදු වීමට නම් අනාගත වැඩ පිළිවෙලවල් යනස් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව ඉදිරිපත් කෙරෙන යෝජනා තුළින්ද පර්යේෂණ කෘතිය නිමාවට පත්වේ.